# මුනිදාස කුමාරතුංගගේ කතා කලාව

කුලතිලක කුමාරසිංහ

විසිවන සියවසේ මුල් භාගයේ සිංහල ගද්‍ය සාහිත්‍යය පෝෂණය කිරීමට උරදුන් සිංහල ලේඛකයන් අතර මුනිදාස කුමාරතුංග පඬිවරයාට ප්‍රමුඛත්වයක් හිමි වේ. එතුමා විසින් රචනා කරන ලද ප්‍රබන්ධ හුදෙක් මනඃකල්පිත වෘත්තාන්ත පමණක් නොවී ය. ප්‍රබල සමාජ දර්ශනයක් ඒ සෑම ප්‍රබන්ධයකින් ම මතුකර දැක්වීමට කුමාරතුංග සැලකිලිමත් වූයේ ය. අධිරාජ්‍යවාදයටත්, යටත් විජිත වාදයටත්, ධනවාදයටත් එරෙහි ව ජාතික ස්වාධීනත්වය, ස්වාධිපත්‍යය, ස්වදේශානුරාගය හා සමාජවාදය නගා සිටුවීම සඳහා ප්‍රබන්ධය ප්‍රබල අවියක් ලෙස උපයෝගී කර ගැනීමට කුමාරතුංග පඬිතුමා පෙළඹුණු බැව් පෙනේ. එතුමා හුදු භාෂා පඬිවරයකු ලෙස පමණක් හඳුන්වා දීමට හෙළ හවුල පවා පෙළඹුණේ එතුමාගේ ගද්‍ය ප්‍රබන්ධ හා බැඳුණු අභිප්‍රාය අමතකකර ය. සෑම ප්‍රබන්ධයකින් ම නිශ්චිත සමාජාර්ථයක් ඉස්මතු කර ලීමට විමසිලිමත් වූ ලේඛකයකු ලෙස කුමාරතුංග හඳුන්වා දීම අතිශයෝක්තියක් නොවේ. එහුගේ ගද්‍ය නිර්මාණ I සරල වෘත්තාන්ත ඇසුරින් සමාජය ගැඹුරින් විවරණය කරන කතා හා II සංකීර්ණ වෘත්තාන්ත ඇසුරින් ජීවිතය, සමාජය, මානව ධර්මතා හා ලෝක ස්වභාවය විවරණය කරන කතා යනුවෙන් දෙකොටසකට බෙදා දැක්විය හැකි ය. මෙකී වෘත්තාන්ත ඇසුරින් එතුමාගේ කතා කලාව පිළිබඳ විවරණයක් කිරීමට පෙර, ප්‍රබන්ධය හා ප්‍රබන්ධකරණය අරභයා කුමාරතුංග පඬිතුමාගේ අවබෝධය හා ආකල්පය කෙබඳු දැයි විමසා බැලීම වැදගත් ය.

එතුමා ප්‍රබන්ධ කරණය අරභයා කරුණු තුනක් මතු කරයි.

"කිමෙක් බඳනා ලැබේ ද ?
කෙසේ බඳනා ලැබේ ද ?
කෙසේ උසස් කරනු ලැබේ ද ?"

© කුලතිලක කුමාරසිංහ
සංස්. පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, රොමේලා රසුල්
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය, 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.